013

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

### 9 - ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/විභාග අංකය :- .................................................................. කාලය: පැය 02යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, II කොටසේ පිළිතුරු පත්‍රය සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- අංක 01 , 02 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) අපට අනුදුන් ලොකු මාමා කිසි දිනක අමතක නොකළ යුතු ය.

(1) උපදෙස් දුන් (2) උපකාර කළ
(3) ආශ්‍රය කළ (4) අතට අත දුන්

(02) ඉවත් බුවත් නැතුව කරන වියදම් නිසා පවුලේ පරිහානිය ඇතිවේ.

(1) වියදම් වැඩි (2) තිබෙන පමණින්
(3) විචාරයකින් තොරව (4) පැමිණි පසු

(03) අක්ෂර උත්පත්ති ස්ථාන අනුව 'ක , ඛ , ග , ඝ , ඞ' අක්ෂර හඳුන්වා ඇත්තේ,

(1) තාලුජ (2) කණ්ඨජ (3) ඕෂ්ඨජ (4) මූර්ධජ

- ඉරි ඇඳි පදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(04) මෝටර් රථයක් නිර්මාණය කළ හැක්කේ ඊට අවශ්‍ය දැනුම හා පරිචය ඇත්තෙකුට පමණි.

(1) වෙනස් වීම (2) නිර්මාණය (3) පළපුරුද්ද (4) ගැළපීම

(05) විචාර ශක්‍යතාව ඇත්තේ බොහෝ ඇසූ පිරූ තැන් ඇති විචාර කලාව පුහුණු කළ රසිකයෙකුට පමණි.

(1) රස විඳීම (2) උත්සාහය (3) බුද්ධිමත් (4) හැකියාව

- ඉරි ඇඳි පදය කුමන ව්‍යාකරණ වර්ගයට අයත්දැයි තෝරා යටින් ඉරක් අඳින්න.

(06) ශිෂ්‍යයන් පාසල් ගියොත් ගුරුවරු උගන්වති.

(1) අසම්භාව්‍ය ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා (4) ආශිර්වාද ක්‍රියා

(07) ගුරුතුමිය සිසුවිය ලවා ගීත ගයවයි.

(1) මිශ්‍ර ක්‍රියා (2) පූර්ව ක්‍රියා (3) ප්‍රයෝජ්‍ය ක්‍රියා (4) අසම්භාව්‍ය ක්‍රියා

(08) ගුරුවරුන් යන පදය.

(1) උක්ත පදයකි.
(2) අනුක්ත පදයකි.
(3) සමූහාර්ථවාචී පදයකි.
(4) නිපාත පදයකි.

(09) අභයගිරි විහාරයේ භික්ෂූන්ට පොහොය කිරීම පිණිස උපෝසථාගාරයක් තනන ලදී.

(1) සන්ධි (2) උපසර්ග (3) නිපාත (4) කෘදන්ත

(10) සෑම පදයක ම නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) ත්‍යාග ප්‍රධානය, බුදු පිළිමය, සංස්කෘතික, පුස්ථකාලය
(2) උපදේශ, නිශ්ශබ්ද, ප්‍රශ්න, භාෂාව
(3) විශිෂ්ට, ඛනිජ, පිළිගනිමු, කථාව
(4) මර්දනය, ඝණ්ඨාර, පරිගණක, ශිෂ්ටාචාරය

(11) අකාරාදි පිළිවෙළට සැකසූ පද පේළිය තෝරන්න.

(1) කලියුගය, යුගාන්තය, ගම්පෙරළිය, මඩොල්දූව
(2) ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, මඩොල්දූව
(3) මඩොල්දූව, කලියුගය, ගම්පෙරළිය, යුගාන්තය
(4) කලියුගය, ගම්පෙරළිය, මඩොල් දූව, යුගාන්තය

(12) 'නා' යන වචනය සඳහා නිවැරදි විවිධ අර්ථ ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) නාගයා , ඇතා , නායක , නා ගස
(2) නිවැරදි , නානවා , නායක , නාදය
(3) අනුවණ , කතාව , නිවැරදි , නාගයා
(4) ඇතා , තද , අනුවණ , නිවැරදි

(13) 'කළත්‍රයා' යන්නට ශබ්ද කෝෂයේ අර්ථ දක්වා ඇත්තේ,

(1) නැන්දා , මාමා
(2) දූ දරුවන්
(3) ස්වාමි පුරුෂයා හෝ භාර්යාව
(4) නෑ හිතවතුන්

(14) 'මහාසාර' නාට්‍යයේ නිර්මාණකරුවා කවරෙක් ද?

(1) දයානන්ද ගුණවර්ධන මහතා
(2) ජැක්සන් ඇන්තනී මහතා
(3) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
(4) කුමාරතුංග මුනිදාස මහතා

(15) ධීවර ව්‍යවහාරයට අනුව 'අම්බලෙවෝ' යනු,

(1) දැල් අදින්නෝ
(2) මාළු වෙළෙන්දෝ
(3) ඔරු අයිතිකරුවෝ
(4) මසුන් මරන්නෝ

- හිස්තැනට සුදුසු ව්‍යාකරණානුකූල නිවැරදි පදය තෝරන්න.

(16) .................................... විසින් පොතක් කියවනු ලැබේ.

(1) මම (2) මා (3) මගේ (4) මට

(17) විදුහල්පතිතුමා විසින් .................................... අමතනු ලැබූහ.

(1) ශිෂ්‍ය නායකයෝ
(2) ශිෂ්‍ය නායකයන්
(3) ශිෂ්‍ය නායිකාව
(4) ශිෂ්‍ය නායකයෙක්

(18) පද්‍ය පාඨයට අනුව ඉරි ඇඳි පද දෙකේ නිවැරදි අර්ථය වන්නේ,

"අවලස්සන කොවුලු කුඩෙ
<u>පත්සිළු</u> <u>ඉවණු</u> නද තැගේ"

(1) වීණාව, පස් දෙව්දුගේ වීණා වාදකයා (2) වෙනත්, පස්දෙව්දුගේ වීණා වාදකයා

(3) පස් දෙව්දුගේ වීණා වාදකයා, වීණාව (4) වීණාව, වෙනත්

• අංක 19 - 20 ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන සුදුසු උත්තර ආඛ්‍යාත පද තෝරන්න.

(19) කුමාරතුංග මුනිදාස මහතා ළමා කෘති රාශියක් රචනා ..........................................

(1) කළෝ ය. (2) කළා ය.

(3) කළේ ය. (4) කරන ලදී.

(20) .............................. අගනා සාහිත්‍ය නිර්මාණ රැසක් බිහි කළහ.

(1) නිර්මාණකරුවෝ (2) නිර්මාණකරුවා

(3) නිර්මාණකරුවන් (4) නිර්මාණකරුවන් විසින්

(ලකුණු 2 × 20 = 40)

## <u>II කොටස</u>

• සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) "සිංහල සාහිත්‍යධරයෝ" යන මාතෘකාව යටතේ, ඔබගේ කණ්ඩායමට පන්තියේ බිත්ති පුවත්පතක් සකස් කිරීමට පැවරුණි.

(1) ඒ සඳහා ඔබ තෝරා ගත් සාහිත්‍යධරයාගේ නම කුමක් ද? (ලකුණු 01)

(2) එම සාහිත්‍යධරයා ලියූ එක් කෘතියක නම ලියන්න. (ලකුණු 01)

(3) එම සාහිත්‍යධරයා සම්බන්ධව ඔබ ලියූ එක් වාක්‍යයක් ගළපා ලියන්න. (ලකුණු 01)

(4) බිත්ති පුවත්පතට ලිපි සකස් කිරීමේ දී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

(02) පහත සඳහන් මාතෘකාවලින් <u>එකක්</u> තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

(1) හික්මීමෙන්, කැපවීමෙන් අභියෝග ජයගනිමු.

(2) කුමාරතුංග මුනිදාස මහතා

(3) අපට උරුම සාරධර්ම

(4) මගෙන් රටට ඉටුවිය යුතු යුතුකම්

(5) සමස්ත ලංකා ගද්‍ය රචනා තරගයෙන් පළමුවැනියා වීම (ලකුණු 20)

(03) පහත දැක්වෙන ඡේදය වචන 25 - 35 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ අග වචන සංඛ්‍යාව ලියන්න.

විවිධ ශෛලීන් අනුව චිත්‍ර නිර්මාණය කරන්නට පිකාසෝ පෙළඹිණි. ඔහුගේ චිත්‍ර නොයෙක් අවධිවලට වෙන් කොට ඇත්තේ එම ශෛලීන්ට අනුව ය. තමා විසින් අත්හැර දැමූ ශෛලියක් නැවත කිසිදිනක ඔහු භාවිත කළේ නැත. මේ නිසා ගෙවී ගිය අවධියේ පිකාසෝ දස වාරයක් පමණ චිත්‍ර කලා ජීවිතයේ පුනරුත්පත්තිය ලබා ඇතැයි විචාරකයෝ පවසති. ස්වීය නිර්මාණයන් ඉතා ඉහළ මිලට විකිණෙන අවස්ථා සියැසින් දැක ගැනීමේ භාග්‍යය ඔහුට උදාවිය. පිකාසෝගේ මුල් යුගයේ චිත්‍රයක් රුපියල් තිස්පත් ලක්ෂයකට අලෙවි විය. (ලකුණු 10)

(04) පෙළ පොතේ උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ".... පළමු වයසෙදී වස්තුව නො නසා කෑම්බිණිත් ආදී කටපුත්තක යෙදූ නම් මෙම නුවර සිටු තනතුරු ලැබෙති."

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය කුමක් ද? (ලකුණු 01)

(ආ) 'කෑම්බිණිත්' යන පදයේ තේරුම ලියන්න. (ලකුණු 02)

(2) "බලන්න මේ පලඳනාව ඇන්දම මගෙ තියෙන එළිය?"

(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවු ද? (ලකුණු 02)

(ආ) මෙම නාට්‍ය නිර්මාණකරුවාගේ වෙනත් නාට්‍යයක් නම් කරන්න. (ලකුණු 02)

(05) 2019 වර්ෂය සඳහා ඔබගේ පාසලේ පුස්තකාලයට අවශ්‍ය පොත් මිල දී ගැනීමට කටයුතු සූදානම් කොට ඇත. අවශ්‍ය පොත් ප්‍රමාණය සහ මිල ගණන් විමසා අංක 44, මහවීදිය, ගාල්ල පිහිටි පුබුදු ප්‍රකාශන සමාගමට යැවෙන ව්‍යාපාරික ලිපිය ලියන්න. ලිපිය ලියන ඔබ, සාහිත්‍ය සංගමයේ ලේකම් යයි සිතන්න. (ලකුණු 10)

(06) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පොරණ පඬින් කළ පත පොත
නුවණ ලැබෙයි කියවුව හොත
නොදන අකුරු කියවනු නැත
අකුරු කමා නැණ ගෙන දෙත

පෙර කල ඔබ වැනි දරුවෝ
ඉගෙන අකුරු මරු මැරුවෝ
අලසව එ අකුරු වැරුවෝ
නම ගම සමගින් දිරුවෝ

(1) "නුවණ" ලබා ගැනීමට නම් කුමක් කළ යුතු ද?
(2) "අකුරු වැරුවෝ" යන පදයේ අර්ථය ලියන්න.
(3) අකුරු වැරුවන්ට සිදු වූයේ කුමක් ද?
(4) මෙම කවිවලට අනුව ළමා කාලයේ දී ගත හැකි උසස් ම ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 2×4 = 08)